# පුරප්පාඩු

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2021.02.25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

අ .පො. ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(II) (අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මගින් ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රෝනික/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (N.V.Q. LEVEL 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

හෝ

(ආ) පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳ වසරක පළපුරුද්දක් සහිත ඉහත (II) (අ) සුදුසුකම්වලට සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 31625-7X300 10X355 -37275 p.m. [U-MT 1 (III)]

**බඳවා ගැනීම :** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වයස :** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

- අයදුම්පත්‍රය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන WWW.SJP.AC.LK මගින් බාගත කර ගත හැකි අතර, සෑම අයදුම්පතක්ම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත්ද සමග සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2021.02.25 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
- විශ්වවිද්‍යාල සේවයේ/රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම්වලින් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුපට ද, 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලටද බැර කරනු ලැබේ. එයට අමතරව තෝරා ගත් අයදුම්කරුවන් වෙනුවෙන් 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවක භාරකාර අරමුදලට බැරකරනු ලැබේ.
- අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**
**2021.02.10**